ටරයකින් ඉහළ යන බව හොංකොං විශ්වවිද්‍යාලයේ භූ විද්‍යාඥ ආචාර්ය ලුන්ග් චෑන් පවසයි. ඉන්දියානු සහ යුරේසියානු භූ තල ගැටීමෙන් මුදාහරින ශක්තිය තාප න්‍යෂ්ඨික (හයිඩ්‍රජන්) බෝම්බයක් පුපුරා යාමට සමානය.

සාමාන්‍යයෙන් සෑම මොහොතකම ගැඹුරු භූ තලයේ නිරන්තර ගැටීම් සිදුවන අතර පොළව මතුපිටදී සිදුවන එම ගැටීමකදී සිදුවන අවදානම බෙහෙවින් ඉහළය. නේපාලයේ සිදුවූ භූ තල ගැටීම සිදු වූයේ පොළොව ආසන්නයේය. මෙම ගැටීමෙන් එම භූ තල මීටර් 2 ක් ඉදිරියට පැන තිබේ. එමගින් තාප න්‍යෂ්ඨදීක (හයිඩ්‍රජන්) බෝම්බ 20 ක් පුපුරා ගිය තරම් දැවැන්ත බලයක් උත්පාදනය වූ බව ආචාර්ය ලුන්ග් චෑන් පවසයි.

## ආසියාව අවදානම්

නේපාලයේ භූමිකම්පාව සම්බන්ධයෙන් මත ඉදිරිපත් කරන ගෝලීය භූ විද්‍යාඥයන් පවසන්නේ ආසියාවේ අවදානම් කලාපවල සිදුවන නාගරීකරණය භූමිකම්පා අනතුරු උග්‍ර කිරීමට ප්‍රධාන වශයෙන් බලපා ඇති බවයි. මෙවැනි නාගරික ප්‍රදේශවල සිදුවූ භූමිකම්පා අනතුරුවලින් කැලිෆෝර්නියාවේ මිලියනයක ජනතාවගෙන් 10 සිට 30 අතර ප්‍රමාණයක් මියගොස් ඇති අතර නේපාලයේ සහ ආසියාවේ එය දස දහස ඉක්මවා තිබේ.

වසරක සියයට 1.14 ක වේගයෙන් සිදුවන ලෝක ජනගහණ වර්ධන අනුපාතය මෙම පාරිසරික අර්බුදය තව තවත් උග්‍ර අතට හරවමින් තිබේ.

ආසියාවේ අවදානම් පාරිසරික කලාපවල සිදුවන නාගරීකරණයෙන් සිදුවූ ප්‍රතිවිපාකවලට කත්මණ්ඩු නගරය කදිම උදාහරණයකි.

ලක්ෂ 15 ක් පමණ ජීවත් වන කත්මණ්ඩු නගරයේ නාගරික සංවර්ධන නීති නොතකා ඉදිකරන ගොඩනැගිලි හේතුවෙන් ඉන්දියානු යුරේසියානු භූ තලය මත දැවැන්ත තෙරපීමක් ඇතිකර තිබෙන බව භූ විද්‍යාඥයන්ගේ මතයයි. ප්‍රවේණික උරුමය බෙදීයැමේදී භූමිය පර්චස් 2-3 කොටස්වලට බෙදී ගොස් ඇති අතර එම පර්චස් ප්‍රමාණයට ඔරොත්තු නොදෙන ගොඩනැගිලි රැසක් දිනෙන් දින කත්මණ්ඩු භූමිය මත දැවැන්ත පීඩනයක් ඇති කරමින් නැගී සිටී. මෙහි අවසන් ප්‍රතිඵලය වන්නේ කත්මණ්ඩු නගරය මැදින් වැටී ඇති ඉන්දියානු - යුරේසියානු භූ තල දෙකේ ගැටීමේ අවදානම තව තවත් වැඩිකරලීම බව භූ විද්‍යාඥයන්ගේ මතයයි.

ඒ වගේම නේපාලය දරිද්‍රතාවයේ පතුලේ මෙන්ම දූෂණයේ ඉහළින් සිටින රටකි. මේ හේතුවෙන් නාගරික අර්බුද තවත් උග්‍ර වී තිබේ. එබැවින් කත්මණ්ඩු නාගරිකයන්ට භූමිකම්පා අවදානම ගැන සිතන්න කාලයක් නොමැත. රාත්‍රියට නිදාගන්නා පැය කිහිපය හැරුණු විට දවසේ වැඩි කාලයක් ඔවුහු වායු දූෂණය, ජල දූෂණය, ජනගහණය, මාර්ග තදබදය, දුප්පත්කම ආදී නාගරික අර්බුද ජය ගැනීමට අරගලයක නිරත වී සිටිති. ඔවුන්ගේ මේ අරගලය භූමිකම්පා අනතුරු ඉහළ යැමට හේතුවක් වී තිබීම දෛවෝපගත සිදුවීමකි.

## මෙවැනි භූමිකම්පාවකින් බොලිවියාවේ මියගියේ පස-"දෙනයි.

භූමිකම්පාවක් කෙතරම් දරුණු දැයි දැනගත හැක්කේ එහි ප්‍රබලතාවය මැනීමෙනි. 1930 ගණන්වලදී චාල්ස් රිකටර් විසින් භූමිකම්පාවල ප්‍රබලතාව මැණීම සඳහා පරිමාණයක් නිර්මාණය කළේය. මෙම පරිමාණයන් අද භූමිකම්පා ප්‍රබලතාව මැනීමට 'රික්ටර් මාපක' යනුවෙන් යොදාගනු ලබයි.

මෙම පරිමාණවලින් භූ කම්පනයේ සිදුවූ හානිය සෑමවිටම හෙළි නොකරයි. ඊට හොඳම උදාහරණය නම් 1994 ජුනි මසදී උතුරු බොලිවියාවේ රික්ටර් මාපක 8.2 ක ප්‍රබලතාවකින් සිදුවූ භූ කම්පනයෙන් මියගියේ පස්දෙනකු පමණක් බව වාර්තාවල සඳහන්ය. එහෙත් 1976 දී රික්ටර් මාපක 8 ක ප්‍රබලතාවකින් චීනයේ ටංෂාන්හි සිදුවූ භූ කම්පනයෙන් සිය දහස් ගණනක් මියගොස් තිබේ.

මින් ඉතා පැහැදිලි වන්නේ ජනතාව පදිංචි භූමිය මත ඉදිකරන අසීමිත ගොඩනැගිලි ඔවුන්ගේම මිනී වළ කපාගන්නා තැනට පත් වී ඇති බවයි. සාමාන්‍යයෙන් භූමිකම්පාවකින් මිනිසාට ඇති වන හානිය ඉතා අවමය. ඉන් බලවත් හානි සිදුවන්නේ ගොඩනැගිලිවලටය. ගොඩනැගිලිවලට යට වී මිනිසුන් මිය යැම ගැන භූමිකම්පාවට දොස් කියා එලක් නැත.

## භූමිකම්පාවකින් ශ්‍රී ලංකාවේ දෙදහසක් මැරිලා

1615 අප්‍රේල් මස 14 වැනි දින කොළඹ නගරයේ නිවාස දෙසීයක් පමණ බිමට සමතලා කරමින් දෙදහසකට පමණ මරු කැඳවමින් සිදුවූ භූමිකම්පාවක් පිළිබඳ විස්තරයක් 1616 ලිස්බන් නගරයේදී මුද්‍රණය වූ පිටු හතරක කුඩා පොතක පල වී තිබූ බව ඓතිහාසික වාර්තා හෙළිකරයි. ජෝර්- රොඩ්ගුස් නමැත්තකු විසින් මුද්‍රණය කර ඇති මෙම කෘතියේ පිටපත් ඉතා කඩිනමින් විකිණී ඇති බව එම වාර්තා පවසයි. ඒ වගේම 1814 ජුනි 14 වැනිදා මඩකලපුවේ දැවැන්ත භූ කම්පනයක් සිදුවී ඇති අතර එම භූ කම්පනයෙන් මුහුදු රළ ඉතා දරුණු වූ බව ඓතිහාසික වාර්තා පෙන්වා දෙයි. 1976 තංගල්ලේ ද 1979 බදුල්ල, පස්සර ප්‍රදේශවල ද 2012 වසරේ අම්පාර ප්‍රදේශයේ ද භූ කම්පන සිදු වී ඇති බව භූ විද්‍යා වාර්තා පෙන්වා දෙයි.

අද අප කත්මණ්ඩු දෙස බලමින් සුසුම් හෙළමින් සිටිය ද එවැනි ඛේදවාචකයක් ශ්‍රී ලංකාවේ සිදු නොවේ යෑයි අපට කිව නොහැක.

කොළොම්බියා විශ්වවිද්‍යාලයේ භූ විද්‍යාඥයන් පවසන පරිදි ඉන්දියානු - ඔස්ට්‍රේලියානු භූ තලය මැදින් ඉරිතලා ගොස් අලුත් භූ තල මායිමක් නිර්මාණය වෙමින් තිබේ. මෙය වසර මිලියන විස්සක් තිස්සේ සිදුවෙමින් පවතින අතර එම භූ තල මායිම ශ්‍රී ලංකාව දකුණු දෙසින් වෙරළේ සිට කිලෝමීටර් 500 ක පමණ දුරින් පිහිටා තිබීම ශ්‍රී ලංකාවේ භූමිකම්පා අවදානම ඉහළ යැමට හේතුවක් වී ඇති බව මෙරට මෙන්ම ගෝලීය භූ විද්‍යාඥයෝ පවසති.

## ජනතාවට පෙර භූමිය

භූමිකම්පා අනතුරු අවම කර ගැනීමට කළ හැකි පහසුම සහ සරලම ක්‍රමවේදය අවදානම් කලාපවලින් ජනතාව ඉවත් කරලීමය. නමුත් එය ප්‍රායෝගික නොවන බව නේපාලයේදී ඔප්පු වී තිබේ.

ආසියානු කලාපයේ දේශපාලන අධිකාරිය සෑම විටම තීන්දු ගත යුත්තේ ජනතාව ගැන සිතා නොව භූමිය ගැන සිතාය. එවිට ජනතාවගේ ආරක්ෂාව නිතැතින්ම සහතික වනු ඇත. ජනතාවගේ අවශ්‍යතාව මත භූමිය තෝරා ගැනීම හේතුවෙන් පාරිසරික ව්‍යසනයන්ට මැදිව දහස් ගණනක් ජනතාව මියගොස් තිබේ. නමුත් ආසියානු කලාපයේ භූමිය ගැන සිතා ජනතාව වෙනුවෙන් තීන්දු ගැනීම මේ දක්වා සිදු වී නොමැත.

නාගරික සංවර්ධනයේදී පොළොව මත තෙරපීම අඩු කෙරෙන ඉදිකිරීම් පිළිබඳ අද ලෝකයේම අවධානය යොමු වී තිබේ. ජපානය ඔවුන්ගේ ගෘහ නිර්මාණ කලාව රැඩිකල්වාදී ලෙස වෙනස් කිරීමෙන් භූමිකම්පාවලින් සිදුවන අනතුරු රැසක් අඩුකරගෙන තිබේ. ඇමරිකාවේ කැලිෆෝනියා ප්‍රාන්තයේ ඉපැරැණි ගඩොල් ගොඩනැගිලි ගලවා ඉවත් කර ඒ වෙනුවට යකඩ කණු අතර ගඩොල් පේලි රඳවා නව ගොඩනැගිලි ඉදිකර තිබේ. භූමිකම්පාවකදී මෙවැනි ගොඩනැගිලිවල බිත්ති කඩාවැටෙන්නේ පැත්තකට නොව සිරස්ව පහළට බැවින් සිදුවන අනතුරු අවම මට්ටමක පවතී.

ආසියාවේ සාම්ප්‍රදායික ගෘහ නිර්මාණ කලාව ද, නිවර්තන නූතනවාදී (Tropicall Modernism) ගෘහ නිර්මාණ කලාවද අභියෝගයට ලක්වෙමින් තිබේ. මේ ගෘහ නිර්මාණ සංකල්ප වෙනුවට භූ කම්පන ආපදා අවම කර ගැනීමේ ගෘහ නිර්මාණ කලාවක් වෙත ගමන් කිරීම දැනටමත් ප්‍රමාද වී තිබේ. 1615 යේ පෘතුගීසි යුගයේදී ශ්‍රී ලංකාවේ සිදුවූ භූමිකම්පාව ගැන කියවීමේදී දැන් කොළඹ නගරය දෙස බලා, මහ පොළොවට තුන්වරක් වැඳ අපට කළ හැකි එකම ඉල්ලීම වන්නේ "ලංකාවේ භූමිකම්පාවක් ඇති නොවේවා යන්න ප්‍රාර්ථනා කිරීම පමණි.

